සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**13 ශ්‍රේණිය** — **ව්‍යාපාර අධ්‍යයනය** — **පිළිතුරු පත්‍රය**

## I කොටස

1 - (2) 2 - (1) 3 - (4) 4 - (1) 5 - (3) 6 - (5) 7 - (1) 8 - (5) 9 - (2) 10 - (1)
11 - (3) 12 - (2) 13 - (1) 14 - (4) 15 - (3) 16 - (1) 17 - (4) 18 - (1) 19 - (5) 20 - (4)
21 - (1) 22 - (4) 23 - (2) 24 - (5) 25 - (2) 26 - (5) 27 - (4) 28 - (5) 29 - (3) 30 - (3)

(31) (අ) ව්‍යාපාර ආචාර ධර්ම සංග්‍රහයක් (ආ) මූල්‍ය හා ගිණුම්කරණ

(32) (අ) සීමාරහිත සමාගම් (ආ) සාර්ව පරිසරය

(33) (අ) පරිසරය සංවර්ධනය සඳහා වූ එක්සත් ජාතීන්ගේ සංවිධානය
(ආ) ගෝලීයකරණය

(34) (අ) ප්‍රතිපත්තිමය පොලී අනුපාතය (ආ) ශ්‍රී ලංකා මහ බැංකුව

(35) (අ) කාලානුරූප බව, කල්පැවැත්ම (ආ) වෙන්දේසිය

(36) (අ) ව්‍යාපාර සැලැස්ම (ආ) මෙහෙයුම් සැලැස්ම

(37) (අ) ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය (ආ) බිලියන 1100 හිඟයක්

(38) (අ) ක්‍රියාකාරී නොවූ (ආ)

(39) (අ) අදහස → සකස් කිරීම → රොර්පණය කිරීම → පැහැදිලි කිරීම
(ආ) ලංකා පුත්‍ර සංවර්ධන

(40) (අ) ආයෝජන තීරණ, මූල්‍ය තීරණ (ආ) ව්‍යාපාර අයිතිකරුගේ ධනය උපරිම

(41) (අ)
(1) සමූපකාර සමිති ලියාපදිංචිය
(2) සමිතිවල ගිණුම් විගණනය කිරීම
(3) රජයේ ප්‍රතිපත්ති සමූපකාර සමිතිවලට දැනුම් දීම සහ ඒවා ව්‍යාප්ත කිරීම
(4) සමූපකාර සමිති පිළිබඳ මහජන පැමිණිලි පරීක්ෂා කිරීම
(5) සමූපකාර සමිති පාලනය කිරීම (control)
(6) සමූපකාර සමිතිවල තත්ත්වය උසස් කිරීමට උපදෙස් දීම.
(7) මූල්‍ය තත්ත්වය දුර්වල සමිති වලට අරමුදල් ලබාගැනීමට සහාය වීම.

(ආ)
(1) නිෂ්පාදිත වරලත් ව්‍යාපාර (Product Franchise)
(2) නිෂ්පාදන වරලත් ව්‍යාපාර (Manufacturing Franchise)
(3) ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර (Business Format Franchise)

(42)

| | වෙළඳ ලකුණු | සන්නම් |
|---|---|---|
| (1) | ලියාපදිංචිය අනිවාර්යය වේ. | අනිවාර්යය නොවේ. |
| (2) | සලකුණක් හෝ ලාංඡනයකි. | කිසියම් භාෂාවකින් ඉදිරිපත් කළ යුතු වේ. |
| (3) | වෙළඳ ලකුණු එකක් පමණක් නිෂ්පාදකයාට පවතී. | සන්නම් විශාල ප්‍රමාණයක් පැවතිය හැක. |
| (4) | සියළුම නිෂ්පාදිත වෙනුවෙන් සකසා ඇත. | එක් ඒක නිෂ්පාදිත වෙනුවෙන් වෙන වෙනම සකස් කර ඇත. |

(43) (1) සන්නිවේදන හැකියාව (2) ආකර්ශනීය පෙනුම (3) ඉවසීම
(4) අවංකබව (5) සුහදශීලීව තර්ක බිඳීමේ හැකියාව

(44) (1) තෝරාගැනීමට ඇති අයිතිය (2) සවන් යොමු කරවාගැනීමට ඇති අයිතිය
(3) වන්දි ලබාගැනීමට ඇති අයිතිය (4) තොරතුරු දැනගැනීමට ඇති අයිතිය

(45) (අ) 1995 අංක 35 දරණ කිරුම් මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත.
(ආ) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය

(46) (1) කෘෂි කාර්මික 10.1%
(2) කාර්මික 32.3%
(3) සේවා 57.6%

(47) (අ) රැකියා ගිවිසුම යනු : පත්වීම් ලිපියට සේවකයාගේ ලිඛිත එකඟත්වය ප්‍රකාශ කළවිට එය රැකියා ගිවිසුම වේ. මෙය සේව්‍යයා සේවකයා අතර සම්බන්ධතාව දක්වන නීත්‍යානුකූල ලියවිල්ලකි.
(ආ) කුසලතා ලේඛනය : ආයතනය තුළ අදාළ තනතුරු සඳහා සේවකයින්ගේ සුදුසුකම් හා රැකියා සම්බන්ධ නඩත්තු කරන ලේඛනයයි.

(48) (අ) වටිනාකම = $\frac{\text{තෘප්තිය / ප්‍රතිලාභ}}{\text{පිරිවැය}}$
(ආ) විශේෂ වෙළඳ භාණ්ඩ බද්ධ

(49) (1) වියළිව තබන්න (2) ගුරුත්ව කේන්ද්‍රය
(3) රෝල් කරන්න එපා (4) අට්ටි ගැසීමේ සීමාව

(50) (අ) දිග අඟල් 7, පළල 3½
(ආ) සාමාජීය ව්‍යවසායකත්වයයි.

**දෙවන කොටස I කොටස**

(01) (i) (අ) කාර්යයන් : මූල්‍ය කටයුතු, අලෙවිකරණ කටයුතු, මානව සම්පත් කටයුතු, පරිපාලන, පර්යේෂණ හා සංවර්ධන කටයුතු
(ආ) රටක ආර්ථික, දේශපාලන, සාමාජීය හා සංස්කෘතික යනාදී කිසිම කටයුත්තක් ව්‍යාපාර හෝ ඒවායේ අනුග්‍රහය නොමැතිව සිදුකළ නොහැක. සෑම කාර්යයක්ම හෝ වැඩසටහනක්ම ව්‍යාපාරවල දායකත්වය හා සහභාගීත්වයෙන් සිදු වේ. එමගින් මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම රැකියා අවස්ථා බිහිවීම බදු මඟින් ආණ්ඩුව පවත්වාගෙන යාම, ආයෝජන තුලින් ආර්ථික වර්ධනය ඇතිවීම, සමාජ සේවා ඉටුවීම හා රටක සංවර්ධනය ඇතිවීම සිදු වේ. (ල.04)

(ii)

| පහසුව | වැසියාම |
|---|---|
| ආරම්භ කිරීම පහසුයි | ප්‍රාග්ධන හිඟය |
| තනි තීරණ ගත හැකියි. | සේවක ප්‍රශ්න |
| අවශ්‍ය අවස්ථාවල වසාදැමිය හැකියි. | මිය යාම / රෝගාතුර වීම |

(ල.04)

(iii) (අ) ගරු කිරීම
වගකීම
ප්‍රතිඵලය
(ආ) ගිණිකෙළි කර්මාන්තය අන්තරාදායක නිෂ්පාදනයකි. බාල වයස්කාරයන්ගේ වගකීම, දුරදක්නා බව, අවබෝධය දුර්වලය, නුපුහුණු අය අසංවිධිතය, එම නිසා කායික මානසික වර්ධනය අඩු වෘත්තීය භාවය අඩු පිරිස් අන්තරාදායක කර්මාන්තයක නිරත කරවීම ඔවුන්ගේ මෙන්ම අන් අයගේද ජීවිතවලට හානිදායකය. ළමා ආරක්‍ෂණ අධිකාරී පනතේද ළමා සේවය තහනම් කර ඇත.

මෙරට කම්කරු නීතියද බාල වයස්කාර ළමුන් සේවයේ යෙදවීමට සීමා පනවා ඇත. ඒ අනුව ළමුන් හා නුපුහුණු කම්කරුවන් මෙවැනි අන්තරාදායක කර්මාන්තවල සේවා නියුක්ත කිරීම නීති හා ආචාරධර්ම වලට පටහැනිය. (ල.04)

(iv) කාන්තා නියෝජනය නිසා : ක්ෂණික ආහාර වර්ග වෙළඳපලට පැමිණීම, දිවා සුරැකුම් මධ්‍යස්ථාන.
වැඩිහිටි ජනගහනය : ජ්‍යෝෂ්ඨ පුරවැසි ඉතිරිකිරීමේ ගිණුම්, වැඩිහිටි නිවාස (ල.04)

(v) <u>හිතකර බලපෑම්:</u>

(1) නවීන තාක්ෂණය ලබාගත හැකිවීම.

(2) ගුණාත්මක විදේශීය අමුද්‍රව්‍ය ලබාගත හැකි වීම.

(3) කාර්යක්ෂම යන්ත්‍ර සූත්‍ර ලබාගත හැකිවීම.

(4) විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම.

(5) දේශීය භාණ්ඩ හා සේවා සඳහා විදේශ වෙළඳපල ලබාගත හැකිවීම. (ල.04)

<u>අහිතකර බලපෑම් :</u>

(1) දැඩි තරගකාරීත්වයකට මුහුණ දීමට සිදුවීම.

(2) දේශීය පුහුණු ශ්‍රමය විදේශීය රටවලට ඇදීයාම.

(3) දේශීය ව්‍යාපාරවල පැවැත්ම අස්ථාවර වීම.

(4) දේශීය සංස්කෘතියේ අයහපත් වෙනස්කම් ඇතිවීම.

(02) (i) (අ) අයිතිකරු, සේවකයින්, පාරිභෝගිකයින්, පරිසරය

(ආ) 1. පරිභෝජනයට නුසුදුසු භාණ්ඩ වෙළඳපොලට ඉදිරිපත් කිරීම.
අසාධාරණ මිල නියම කිරීම.
ජනප්‍රිය සන්නම් යටතේ බාල භාණ්ඩ ඉදිරිපත් කිරීම.
අයථා ප්‍රචාරණ කටයුතු සිදු කිරීම.
අසත්‍ය තොරතුරු ලබා දීම. වැනි දෑ....

2. නීති රීති සම්පාදනය
නිතර නිතර වැටලීම් සිදු කිරීම.
පාලන මිල නියම කිරීම.
පාරිභෝගිකයා දැනුවත් කිරීම.
ප්‍රමිති හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම.

(ii) (1) නියමිත බදු ගෙවීමෙන්.

(2) සේවා නියුක්තියට දායක වීම මඟින්.

(3) දේශීය සම්පත් නිෂ්පාදන ක්‍රියාවලියට යොදාගැනීම මඟින්.

(4) විදේශ විනිමය ඉපයීමට දායක වීම මඟින් වැනි අනිකුත් කරුණු විස්තර කිරීමට.

(iii) (අ)

| හවුල් ව්‍යවස්ථාවලිය | සාංගමික ව්‍යවස්ථාවලිය |
|---|---|
| 1. හවුල් ව්‍යාපාර සඳහා අදාල වේ. | 1. සංස්ථාපිත සමාගම් සඳහා අදාල වේ. |
| 2. සියළුම හවුල්කරුවන් විසින් ඊට අත්සන් කළ යුතුය. | 2. අවම කොටස්කරුවන් සංඛ්‍යාවක් පමණක් අත්සන් කිරීම ප්‍රමාණවත් වේ. |
| 3. නිශ්චිත ආකෘතියක් නැත. | 3. නිශ්චිත ආකෘතියක් ඇත. |
| 4. ඇරඹීමේදී අවශ්‍ය නොවේ. | 4. සමාගමක් ඇරඹීමේදී සාංගමික ව්‍යවස්ථාවලිය අවශ්‍යම වේ. |
| 5. ලියාපදිංචියට අවශ්‍ය නොවේ. | 5. අවශ්‍ය වේ. |

(ආ) විශාල ප්‍රාග්ධනයක් රැස්කරගත හැකිවීම.
සාපේක්ෂ වශයෙන් අඩු බදු අනුපාතයක් අය කිරීම.
ඕනෑම කොටස් හිමියන් සංඛ්‍යාවක් සම්බන්ධ කරගත හැකිවීම.
දක්ෂ සේවකයන් ආකර්ශනය කරගත හැකිවීම.
අන්තර් ජාතික වශයෙන් ව්‍යාප්ත කිරීම පහසු වීම.

(iv) සංස්ථා ප්‍රකාශය : සමාගමක කොටස් හෝ ණයකර මිලදී ගන්නා ලෙස මහජනයාට ප්‍රසිද්ධියේ කරනු ලබන ඕනෑම ආරාධනාවක් මින් අදහස් වේ.

ප්‍රතිරක්ෂණය : සීමිත පොදු සමාගමක කොටස් නිකුතුවකදී අවම කොටස් ප්‍රමාණයක් සඳහා මහජනයා සහභාගී නොවුනහොත් එම ප්‍රමාණය මිලදී ගැනීම සඳහා මූල්‍ය ආයතනයක් සමඟ ඇතිකරගන්නා ගිවිසුමයි. අවම සහභාගයට නොඅඩු මුදලක් රැස් කර ගැනීමට මෙය වැදගත් වෙයි.

(v)

| මුදල් සැපයුම වැඩිකිරීම | උපකරණ | මුදල් සැපයුම අඩු කිරීම |
|---|---|---|
| සංචිත අවශ්‍යතා පහළ හෙලීම | සංචිත අවශ්‍යතා | සංචිත අවශ්‍යතා ඉහළ increase දැමීම |
| වට්ටම් අනුපාත පහළ දැමීම | වට්ටම් අනුපාත | වට්ටම් අනුපාත ඉහළ දැමීම |
| සුරැකුම්පත් මිලදී ගැනීම | විවෘත වෙළඳපොල කටයුතු | සුරැකුම්පත් විකිණීම |
| ණය පාලනය ලිහිල් කිරීම | තෝරාගත් ණය පාලන | ණය පාලනය දැඩි කිරීම හෙවත් වැඩි කිරීම |

(03) (i) (අ) ව්‍යවසායකයා තුළ සාමාන්‍ය ව්‍යාපාරිකයකුට වඩා දකින වෙනස්කම් වන්නේ,

- දැක්මක් සහිත වීම
- ධනාත්මක චින්තනයක් සහිත වීම
- නිර්මාණ ශීලීත්වය
- අවස්ථා හඳුනා ගැනීම
- ආත්ම විශ්වාසය
- වෙනත් පිළිගත හැකි කරුණු
- සුභවාදී වීම
- අවදානම්වලට මුහුණ දීම

(ආ) <u>පුද්ගල මට්ටමේ ප්‍රතිලාභ</u>

- ආත්ම තෘප්තිය
- කුසලතා සංවර්ධනය
- සාමාජීය නායකත්වය
- මූල්‍ය ප්‍රතිලාභ
- කීර්තිනාමය

<u>ආයතනික මට්ටමේ ප්‍රතිලාභ</u>

- තරගකාරීත්වය ජය ගැනීම
- අඛණ්ඩ පැවැත්ම තහවුරු වීම
- තරගකාරීත්වයක්
- පරිසර වෙනස්වීම් වලට අනුකූ වීමේ හැකියාව
- කීර්ති නාමය වර්ධනය

<u>ජාතික මට්ටමේ ප්‍රතිලාභ</u>

- ආර්ථික වර්ධනය
- දේශීය සම්පත් උපයෝජනය
- රැකියා අවස්ථා ජනනය
- ජාත්‍යන්තර වෙළඳපල තරගකාරීත්වය

(ii) (අ)
- මහ බැංකුවේ ලියාපදිංචි කල මූල්‍ය සමාගමක්ද යන්න
- ණය ශ්‍රේණිගත කිරීම / මූල්‍ය ස්ථාවරත්වය
- ගෙවනු ලබන පොලිය
- සමාගමේ මූල්‍ය තොරතුරු (අතීත)
- සමාගමේ ඉතිහාසය
- අධ්‍යක්ෂවරු හා කළමනාකරණය
- ආයෝජන කාලය

(ආ)
- ආදායකයාට මුදල් ලැබෙන බව සහතික වීම.
- බැංකු කවුන්ටරයෙන් මුදල් ගෙවීම වැළැක්වීම.
- චෙක්පතෙහි මතුපිට සඳහන් ආකාරයටම ආදායකයාගේ නම චෙක්පතෙහි පිටුපස සඳහන් කිරීම.

(iii)
- ප්‍රාදේශීය සම්පත් ප්‍රයෝජනයට ගැනීම.
- ප්‍රාදේශීය සංවර්ධනයට.
- රැකී රක්ෂා ඇති කිරීමට.
- දල ජාතික නිෂ්පාදනය වැඩි දායකත්වයක් ලබාදීමට.
- දේශීය ව්‍යවසායකත්ව සංවර්ධනයට අවස්ථාව සැලසීමට.
- මහා පරිමාණ ව්‍යාපාර ඉදිරිපත් නොවන ව්‍යාපාර ආරම්භ කිරීමට.

<u>ණය යෝජනා ක්‍රම</u>

- සමෘධි ණය යෝජනා ක්‍රමය
- සු.ම.දි.
- සු.ව.න.
- ගැමි පුබුදු වැඩ සටහන
- ග්‍රාමීය බැංකු නම්‍යතා ව්‍යාපෘතිය ආදි අනෙකුත් යෝජනා ක්‍රම

(iv) (අ)
- තැන්පතු පවත්වාගෙන යාම
- ණය පහසුකම් සැලසීම
- කල් බදු සේවා
- ණයවර ලිපි සේවා
- උකස් කටයුතු
- ටෙලි බැන්කින්
- නියෝජිත සේවා
- ස්වංක්‍රීය බැංකු සේවා ඇතුළු අනෙකුත් සේවා

(ආ)
- වෙළඳ ලකුණු හා කීර්තිනාමය වරලත් ලාභියාට හිමිවීම.
- අඩු ආයෝජනයකින් ව්‍යාපාරය ව්‍යාප්ත කළ හැකි වීම.
- වෙළඳ පලට පහසුවෙන් පිවිසිය හැකි වීම.
- සේවක පුහුණුව හා ශිල්පීය ඥාණය ලබාගත හැකි වීම.

(v) (අ) (1) පහසුවෙන් හඳුනාගත හැකිවීම. (2) කල්පැවැත්ම.
(3) කුඩා ඒකකවලට බෙදිය හැකි වීම. (4) පහසුවෙන් ගෙන යා හැකිවීම.
(5) අනුකරණයේ දුෂ්කරතා. (6) දුබල හෝ සුලභ නොවීම.

(ආ) (1) ව්‍යවහාර මුදල් : රටේ මූල්‍ය අධිකාරියේ නියෝගය මත නිකුත් කරන කාසි හා නෝට්ටු.
(2) බැංකු මුදල් : වාණිජ බැංකු පවත්වාගෙන යන ඉල්ලුම් තැන්පතු හෙවත් ජංගම ගිණුම් වල ඇති ශේෂ.

(04) (i) (අ)
- ණයපත් හිමියන්
- ණයපත් සංගමය
- අනුමත වෙළඳසැල්
- ණයපත් නිකුත් කරනු ලබන මූල්‍යාතන

(ආ) <u>ගණුදෙනුකරුවන්ට :</u>
- භාවිතා කිරීම වඩාත් පහසු වීම.
- නිශ්චිත කාලසීමාවක් දක්වා පොලී රහිත ණයත් වීම.
- ජාත්‍යන්තර වෙළඳපළේදී පවා භාවිතා කළ හැකි වීම.
- ආරක්ෂා සහිත වීම.

<u>මූල්‍යාතනවලට :</u>
- මූල්‍ය ආයතනයේ කීර්තිනාමය ඉහළ යාම.
- මූල්‍ය ආයතනය තුළ සිටින ගණුදෙනුකරුවන් සංඛ්‍යාව ඉහළ යාම.
- විදේශීය ණයපත් මෙහෙයවීමේදී විනිමය වාසි ලබාගත හැකිවීම.

(ii) (අ) අවධානය කිසියම් වත්කමකට හෝ විෂය වස්තුවකට අලාභ නැතහොත් හානියක් සිදුවීමට හෝ සිදු නොවීමට ඇති අවිනිශ්චිතතාවයයි.

උපද්‍රවය යනු කිසියම් විෂය වස්තුවකට හානියක් සිදුවීමට බලපාන හේතු වේ. (උදාහරණ : ගින්න, ජල ගැලීම්)

උපද්‍රවශීලීත්වය යනු උපද්‍රවය වැඩි අඩු වීමට බලපාන සාධක වේ.

(ආ)
- වන්දි ලබාගැනීමේ ක්‍රියාවලිය සංකීර්ණ වීම.
- පැවරුම් ලාභියා පිළිබඳ ඇතිවන ගැටලු.
- අවබෝධයක් නැතිකම.
- රෝග විනිශ්චය හා මරණය පිළිබඳ ඇතිවන ගැටලු.
- අනන්‍යතාව ඔප්පු කිරීමට ලියවිලි ඉදිරිපත් කළ යුතු වීම.

(iii) (අ) සන්නිවේදනයෙන් බලාපොරොත්තුවන අරමුණු ඉටුවන පරිදි සිදු වන සන්නිවේදනය සඵලදායී සන්නිවේදනය වේ.

(ආ) <u>ගුණාංග</u> :
- භාවිතාකිරීම පහසු වීම.
- තොරතුරු වලට ප්‍රවේශ වීම පහසු වීම.
- පුද්ගලයන් අතර අන්තර් ක්‍රියාකාරීත්වයක් ඇතිවීම.
- ආයතන අතර අන්තර් ක්‍රියාකාරීත්වයක් ඇතිවීම.
- රහස්‍යභාවය ආරක්ෂා වීම.
- තොරතුරු ලබාගැනීම පහසු වීම.

(iv) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ඉදි වී ඇති හා ඉදිවෙමින් පවතින අධිවේගී මාර්ග නම් :

- දක්ෂිණ අධිවේගී මාර්ගය
- කොළඹ කටුනායක අධිවේගී මාර්ගය
- කොළඹ පිටරවුම අධිවේගී මාර්ගය
- නුවර කොළඹ අධිවේගී මාර්ගය

<u>පහත වාසි :</u>

- මාර්ග ප්‍රවාහනයේ වේගවත් බව වැඩිවීම.
- මාර්ග තදබදය අඩුවීම.
- වෙළඳ පොළ ව්‍යාප්ත කරගැනීමට වැදගත්වීම.
- පිරිවැය අඩු වීම.
- ව්‍යාපාර දියුණු වීම.

(v) නිෂ්පාදකයා වෙබ් අඩවියක් නිර්මාණය කර අන්තර් ජාලය හරහා ඇණවුම් ලබාගෙන භාණ්ඩ ලබාදීම විද්‍යුත් සිල්ලර වෙළඳාම වේ.

<u>ප්‍රතිලාභ :</u>

- පහසුවෙන් හා ඉක්මනින් භාණ්ඩ ලබාගත හැකිවීම.
- අඩු පිරිවැයකින් ලබාගත හැකිවීම.
- තෝරා ගැනීමේ පරාසරය පුළුල් වීම.
- තොරතුරු ලබාගැනීම පහසු වීම.
- ගෙවීම් කටයුතු පහසු වීම.

## II කොටස

(05) (i) ගැටලුවකට විසඳුමක් ලෙස විවිධ විකල්ප අතරින් යෝග්‍යතම විකල්පය තෝරාගැනීම තීරණයක් වේ.

<u>පියවර :</u>

- ගැටලුව හඳුනා ගැනීම.
- විකල්ප විසඳුම් ගොඩනැගීම.
- විකල්ප ඇගයීම.
- හොඳම විකල්පය තේරීම.
- ක්‍රියාත්මක කිරීම.
- තීරණ ගැනීම

(ii) සම්පත්වල හිඟතාව හේතුකොට ගෙන ඒවා උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිතා කිරීම මඟින් ව්‍යාපාරවල අරමුණු හා පරමාර්ථ සඵලදායකව ඉටුකිරීමේ වගකීම කළමනාකරුවන් වෙත පැවරී ඇති ප්‍රමුඛතම අභියෝගයයි. ඊට අමතරව,

1. වෙළඳපොල තරගකාරීත්වය දිනෙන් දින ඉහළ යාම.
2. ව්‍යාපාර පරිසරය තුළ සිදුවන වේගවත් වෙනස්වීම්.
3. ව්‍යාපාර ආචාරධර්ම සහ සමාජ වගකීම් සංකල්පය වර්ධනය වීම.
4. දැනුම, තොරතුරු මත පදනම්ව සමාජයක් නිර්මාණය වෙමින් පැවතීම.

(iii)

- කාර්යක්ෂමතාව : සම්පත් නාස්තිය අපතේ යාම අවම කොට සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි කටයුතු කිරීමයි.
- සඵලදායකත්වය : උචිත දෙය කාලය තුල සිදු කිරීමයි.
- ඵලදායිතාවය : නියමිත කාලයක් තුළ සංවිධානයක යෙදවුම් හා නිමැවුම් අතර ඇති අනුපාතික සම්බන්ධතාවය වේ.

$$\text{ඵලදායිතාවය} = \frac{\text{නිමැවුම්}}{\text{යෙදවුම්}}$$

(iv) කාර්යක්ෂම සහ සඵලදායක කළමනාකරුවකු තුළ තිබිය යුතු සුදුසුකම්.

දැනුම (Knowledge)
වෘත්තීය දැනුම
- කළයුතු දෑ
- කළයුතු ආකාරය

කුසලතා (Skills)
- සාමාන්‍ය කුසලතා (තව පැහැදිලි කරන්න)
- විශේෂ කුසලතා

ආකල්ප (Attitudes)

(v)

- හිමිකාරත්ව මූල්‍යනය : අයිතිකරු ප්‍රාග්ධනය තුළින් සිදුවන අරමුදල් සම්පාදනය. (නිදසුන් : සාමාන්‍ය කොටස් නිකුතුව, රඳවාගත් ලාභ)
- ණය මූල්‍යනය : බාහිර පාර්ශවයන්ගෙන් අරමුදල් ලබා ගැනීම. (නිදසුන් : ණයකර, වරණීය කොටස්, දිගුකාලීන ණය ගැනීම්)
- දෙමුහුන් මූල්‍යනය : ණය මූල්‍යනය හා හිමිකාරත්ව මූල්‍යනය යන අංශ දෙක අතර මැදි වූ මූල්‍ය සම්පාදන මාර්ග වේ. (නිදසුන් : පරිවර්තන්‍ය ණයකර, පරිවර්තන්‍ය වරණීය කොටස්)

(06) (i)

- පුහුණුව සේවකන්ට ලබාදේ.
- සංවර්ධනය කළමනාකරුවන්ට ලබාදේ.
- පුහුණුව තාක්‍ෂණික කුසලතා වර්ධනයට යොදාගන්නා අතර සංවර්ධනය මනෝභාවාත්මක කුසලතා වර්ධනයට යොමුවේ. පුහුණුවට වඩා වැඩි පිරිවැයක් සංවර්ධනයට වැයවේ.

(ii)

- නව නිෂ්පාදන ක්‍රම සොයා ගැනීමට හැකිවීම.
- නව නිෂ්පාදිත සොයා ගැනීමට හැකිවීම.
- පිරිවැය අඩු කිරීමට හැකි වීම.
- මිල අඩු ද්‍රව්‍ය සොයා ගැනීමට හැකිවීම.
- නිෂ්පාදිතවල ගුණත්වය ඉහළ නංවාගැනීමට හැකිවීම.
- වෙළඳ පොලෙහි අලෙවිය අඩුකර ගැනීමට හැකිවීමෙන් නිෂ්පාදිතවල මිල අඩු වීම. (කරුණු 06 කට ලකුණු දෙන්න. පැහැදිලි කිරීම් ඇතුළත්ව)

(iii)

$$EOQ = \sqrt{\frac{20D}{H}}$$

$$EOQ = \sqrt{\frac{2 \text{ x } 300 \text{ x } 12000}{5}}$$

$$EOQ = \frac{5}{\sqrt{144000}}$$

$$EOQ = 1200$$

(iv)
(1) සේවක ඵලදායකත්වය වර්ධනය කර ගැනීම. (පැහැදිලි කරන්න.)
(2) රැකියා ජීවිතය සංවර්ධනය කර ගැනීම.
(3) සේවකයා තුළ සංවර්ධනයක් ඇති කිරීම.
(4) සේවක නීතිරීති ශක්තිමත් කිරීම.

(v)
(අ) යම් නිශ්චිත කාලයක් තුළ නිපදවිය හැකි උපරිම ඒකක ප්‍රමාණයයි.
(ආ) භූමියේ පිහිටීම / ප්‍රවාහය පිරිවැය හා පහසුව / වෙළඳ පලට ඇති සමීප බව / ප්‍රාදේශීය පරිසරය තුළින් ලබාගත හැකි පහසුකම් / රජයේ දිරිගැන්වීම් සහ සහන ලබාගැනීම / ශ්‍රමය.

(07) (i)
(අ) ගෙවන මුදලට සරිලන වටිනාකමක් ලබාගැනීම සඳහා භාණ්ඩය තත්වයෙන් උසස් විය යුතුය. ගුණාත්මක භාවය වැඩිකර ගැනීම සඳහා තත්වපාලනය තිබිය යුතුය.
(ආ) තත්ව පාලනය ආයතනයක ලාභදායිතාවය කෙරෙහි බලපාන ආකාරය.
(1) නාස්තිය හා අපතය අඩුවීම. පිරිවැය අඩුවීම තුළින් ලාභය වැඩිවීම.
(2) පාරිභෝගික විශ්වාසය වැඩිවීම තුළින් ඉල්ලුම වැඩිවීම.
(3) ආයතනයේ කීර්තිනාමය ඉහළ යාම.
(4) තරඟකාරීත්වයට සාර්ථක ලෙස මුහුණ දිය හැකිවීම.
(5) සේවක අභිප්‍රේරණය.

(ii)
(1) රැඳී සිටීමේ පරමාර්ථය
(2) විකුණුම් වැඩිකර ගැනීමේ පරමාර්ථය
(3) ලාභය උපරිම කිරීමේ පරමාර්ථය
(4) ආදායම් උපරිම පරමාර්ථය

(iii)
(1) ආයතනය පිළිබඳ ප්‍රතිරූපය ඉහළ නැංවිය හැකිවීම.
(2) ඉලක්ක වෙළඳපොල හඳුනාගැනීම හා පුද්ගල ජීවන රටාවන්.
(3) හඳුනාගැනීමට හැකිවීම.
(4) භාණ්ඩ පිළිබඳ තිබෙන අත්දැකීම් හා දැනීම් වැඩි කිරීම.

(iv) රැකියා පිරිවිතරය : යම් කිසි රැකියාවක් කාර්යක්ෂමව සහ සඵලදායකව ඉටුකිරීමට රැකියාව දරන්නා සතුවිය යුතු මූලික සුදුසුකම් සඳහන් විස්තරය.

රැකියා විශ්ලේෂණය : ව්‍යාපාරය විසින් නිර්මාණය කරන ලද රැකියාව පිළිබඳවත් අදාල රැකියාව තුළ නිරත විය යුතු පුද්ගලයා පිළිබඳවත් විමසා බලා ඒ සඳහා පැවතිය යුතු ගති ලක්ෂණ පිළිබඳව කරනු ලබන විශ්ලේෂණය රැකියා විශ්ලේෂණය වේ.

(v) • කාර්යඵල ඇගයුම • පරිපාලන අරමුණු • සංවර්ධන අරමුණු (විස්තර කළ යුතුයි.)

(08) (i) (අ) කිසියම් ආයතනයක් විසින් ඉටුකර ගැනීමට අපේක්ෂිත ඉලක්ක පරමාර්ථ තීරණය කිරීමෙන් ඒවා ප්‍රශස්ථ ලෙස සපුරා ගැනීමට අවශ්‍ය උපාය උපක්‍රම තීරණය කිරීමේ සමස්ථ ක්‍රියාදාමය ''සැලසුම් කරණයයි.''

(1) පරිසර විශ්ලේෂණය

(2) දැක්ම, මෙහෙවර, පරමාර්ථ, ඉලක්ක ස්ථාපිත කිරීම

(3) සම්පත් විශ්ලේෂණය

(4) උපායමාර්ග හඳුනාගැනීම

(5) සැලසුම් ක්‍රියාත්මක කිරීම

(6) මැන බැලීම

(ආ) ආයතනයක මනා ලෙස සකස් කල සැලසුම් තිබුනත් හොඳ සංවිධාන ව්‍යුහයක් හා සේවකයන් සිටියත් කුමන සම්පත් තිබුණත් සාර්ථක නායකත්වයක් නැතිනම් එය සාර්ථක නොවේ. සාර්ථකත්වයේ යතුර නායකත්වයයි.

(1) දැක්මක් ඇත. ඔහු ආයතනයේ වෙනස්වීම් කල්තියා හඳුනා ගෙන ඊට අනුරූපව කටයුතු කරයි.

(2) අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමට කටයුතු කරයි.

(3) සේවකයන් අභිප්‍රේරණය කරයි.

(4) සංවිධානයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට මඟ පෙන්වයි.

(ii) සෑම කළමනාකරුවෙක්ම වැඩ කළ යුත්තේ සජීවී, විවිධ චර්යා රටා සහ ආකල්පවලින් යුක්ත ඉහළ හා පහළ මිනිසුන් සමගයි. (මෙය හොඳින් විස්තර කර ඇත්නම් ලකුණු 04 ම දෙන්න.)

(iii) සජීවීබව / ප්‍රතික්‍රියා හා ප්‍රතිචාර දැක්වීමට ඇති හැකියාව / සිතීමට හැකියාව / සංවිධානය වීමේ හැකියාව යනාදිය

(iv) යෝග්‍ය වැඩ පරිසර සැකසීම / සේවක පුහුණුව හා සංවර්ධනය / රැකියා සුරක්ෂිතාව ඇතිකිරීම / සුභසාධක පහසුකම් ඇතිකිරීම යනාදිය.

(v) වර්තමානයේ පවතින දැඩි තරඟකාරීත්වය හමුවේ ව්‍යාපාරික අරමුණු ඉටුකරගත හැක්කේ පාරිභෝගිකයාගේ අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමෙන් පමණි. ඒ නිසා වර්තමාන අලෙවිකරණ ක්‍රියාවලිය තුළ පාරිභෝගිකයාට වැදගත් ස්ථානයක් හිමිවේ.